**විසර්ජන ශීර්ෂය 180 - සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව -2012 වර්ෂය**

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

2 කොටස - එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව

1 කොටස

**සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළබඳ සම්පිණ්ඩන වාර්තාව**

1. **අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| වැය ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 289 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |

2. **ගිණුම්**

2.1 **විසර්ජන ගිණුම**

(අ) **මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 01 ක් සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.755,520,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.655,281,940 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයෙ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.141,912,699 ක සිට රු.59,485,361 දක්වා වූ පරාසයක ප්‍රමාණයකින් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 සිට සියයට 20 ක් දක්වා පරාසයක පැවැතින. විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | | 2012 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 180 | සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය | 125,160,000 | 70,400,000 | 113,919,453 | 40,887,848 | 11,240,547 | 29,512,152 |
| 289 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 317,460,000 | 242,500,000 | 277,469,326 | 223,005,313 | 39,990,674 | 19,494,687 |
| | **එකතුව** | 442,620,000 | 312,900,000 | 391,388,779 | 263,893,161 | 51,231,221 | 49,006,839 |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් පහත සඳහන් පරිදි එකතුව රු.51,186,000 ක් වූ ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර ඒවා උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ දිස්ත්‍රික් ලේකම් කාර්යලය/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ලැබුණු ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය/අතිරික්තය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 50,406,000 | 41,474,646 | 8,931,353 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාල - කොළඹ | 480,000 | 492,225 | (12,225) |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාල - ගම්පහ | 300,000 | 194,333 | 105,667 |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 01 ක් වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු පහත සදහන් සීමාවන් පළිපැද තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 180 | 18001 | 2,500,000 | 2,218,669 | 1,000,000 | 1,441,164 | 12,300,000 | 6,276,553 |
| 289 | 28901 | 29,500,000 | 24,188,727 | 20,000,000 | 27,562,726 | 110,000,000 | 90,132,658 |

## 2.3 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### (අ) අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 01 ක 2012 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ගිණුම් වල රු.527,802,404 ක්වූ හර ශේෂ හා රු.527,800,270 ක්වූ බැර ශේෂ පැවැතුණි. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31දිනට ශේෂය හර/ (බැර) | |
|---|---|---|
| | රු. | |
| සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය | 1,800 | හර |
| අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 527,800,604 | හර |

527,800,270 බැර

**(ආ) පොදු තැන්පත් ගිණුම්**

--------------------------

2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේනතු 01 ක පොදු තැන්පත් ගිණුම්වල ශේෂවල එකතුව රු.2,776,209 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ගිණුම් අංකය | 2012 දෙසම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය | 6000/0000/00/0015/0189/000 | 48,772 |
| අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 0289-15/144 | 2,727,437 |
| | | 2,776,209 |

## 11 කොටස

-----------

## එක් එක් විසර්ජන ශිර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව

--------------------------------------------------------------

### 1. විසර්ජන ශිර්ෂය 180 - සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය

----------------------------------------------------------------------

### 1.1 විගණන විෂය පථය

--------------------

සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 අගෝස්තු 06 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 1.3 විගණන නිරීක්ෂණ

-------------------

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සෙයා ගැනිම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ).** **ගිණුම් ඉදිරිපත් කිරීම**

අමාත්‍යාංශය විසින් 2013 මාර්තු 31 දින වන විට ඉදිරිපත් කළ යුතුව තිබූ පහත සඳහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර තිබුණි.

| ශීර්ෂය/ ආදායම් සංකේතය/ විෂය අංකය | ගිණුමේ නම |
|---|---|
| 180 | විසර්ජන ගිණුම |
| 18001 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශනය |

**(ආ).** **විසර්ජන ගිණුම**

**(i).** **මුළු ප්‍රතිපාදනය හා වියදම**

සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.195,560,000 ක් වූ අතර වර්ෂය අවසාන වන විට ඉන් රු.154,807,301 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු.40,752,699 ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 21 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 125,160,000 | 125,160,000 | 11,240,547 | 9 |
| මූලධන | 70,400,000 | 70,400,000 | 29,512,152 | 42 |
| එකතුව | 195,560,000 | 195,560,000 | 40,752,699 | |

**(ii).** **අයවැය විචලනය**

- වැය විෂයයන් 06 ක් සඳහා සලසා තිබුණු රු.3,150,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

- වැය විෂයයන් 18 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 29 ත් සියයට 97 අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

**(iii).** **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් පහත සඳහන් පරිදි එකතුව රු.51,186,000 ක් වූ ප්‍රතිපාදන ලබා දි තිබුණු අතර ඒවා උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ දිස්ත්‍රික් ලේකම් කාර්යලය/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ලැබුණු ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය/අතිරික්තය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 50,406,000 | 41,474,646 | 8,931,353 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාල - කොළඹ | 480,000 | 492,225 | (12,225) |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාල - ගම්පහ | 300,000 | 194,333 | 105,667 |

**(ඇ).** **අග්‍රිම ගිණුම**

මු.රෙ.371(2) අනුව අතුරු අග්‍රිමයක් එය දෙන ලද කාර්ය නිමකළ විගසම පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී අවස්ථා 09 කදී ලබාගන්නා ලද රු.105,570 ක් වූ අතුරු අග්‍රිමයන් පියවීම සඳහා මාස 1 සිට මාස 10 දක්වා වූ කාලයක් ප්‍රමාද කර තිබුණි.

**(ඈ).** **පොදු තැන්පත් ගිණුම**

2012 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.48,772 ක් වූ අතර කාල විශ්ලේෂණය අනුව එම ශේෂ වර්ෂයකට අඩු කාලයක් තිස්සේ ගිණුමේ රැඳී තිබුණි.

## 1.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 1.4.1 වාර්ෂික කාර්යසාධන වාර්තා

2002 සැප්තැම්බර් 12 හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402(1) ප්‍රකාර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත අමාත්‍යාංශය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව පරීක්ෂණ දිනය වූ 2013 ජූනි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**1.4.2 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**1.5 වත්කම් කළමනාකරණය**

**(අ). වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

කෘෂිකර්ම අමාත්‍යාංශය සතු රු.6,300,000 ක් වටිනා වාහන 03 ක් 2010 වර්ෂයේ සිට අමාත්‍යාංශයේ ප්‍රයෝජනය සඳහා යොදාගෙන තිබුණත් මෙම වත්කම් නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ). බේරුම් නොකළ බැරකම්**

අමාත්‍යාංශය විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.585,026 ක් වූ අතර, ඒ පිළිබඳ කාල විශ්ලේෂණය අනුව ඒවා වර්ෂය නොඉක්මවූ බැරකම් විය.

**1.6 කාර්යසාධනය**

**සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම**

(අ). අමාත්‍යාංශය පිළියෙල කළ සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්මට අනුව 2012 වර්ෂයේදී අංක 1992/46 දරන අපනයන කෘෂිකර්ම ප්‍රවර්ධන පනත හා 1972/11 දරන රාජ්‍ය කෘෂකාර්මික සංස්ථා පනත යාවත්කාලීන කර නිම කිරීමට සැලසුම් කර තිබුණත් 2013 මැයි 31 වන විටත් අපනයන කෘෂිකර්ම ප්‍රවර්ධන පනත පමණක් කෙටුම්පත් කෙරෙමින් පැවතුනි.

(ආ). අමාත්‍යාංශයේ සංයුක්ත සැලැස්මට අනුව පාර්ශවකරුවන් දැනුවත් කිරීමට ගුවන් විදුලි හා රූපවාහිනී ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් සකස් කිරීම දක්වා තිබුණත් ඒවා ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ඇ). ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණු පහත සඳහන් කාර්යයන් අපේක්ෂිත ප්‍රගතිය කරා ළඟාවී නොතිබුණි.

(i). සුළු අපනයන භෝග ක්ෂේත්‍රයේ ජාතික ප්‍රතිපත්ති මාලාවක් හා නෛතික රාමුවක් සැකසීම වර්ෂය අවසාන වන විට නිමකළ යුතු වුවත් ප්‍රතිපත්ති මාලාව 2013 මැයි 31 වන විටත් අමාත්‍ය මණ්ඩලය වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ii). මහා පරිමාණ කොකෝවා වගාවන් සඳහා 5 අවුරුදු සැලසුමක් සකස් කර ඇතත් එය ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii). ක්ෂේත්‍රයේ ව්‍යාප්ති නිලධාරීන්ගේ ආකල්ප හා කාර්යක්ෂමතාව සංවර්ධනය සඳහා වැඩමුළු 12 ක් සැලසුම්කර තිබුණත් දිස්ත්‍රික්ක 06 ක් සඳහා වැඩමුළු 02 ක් පමණක් පවත්වා තිබුණි.

(iv). ප්‍රාදේශීය ව්‍යවසායකත්ව වැඩමුළු 12 ක් සමාලෝචිත වර්ෂය තුළ පැවැත්වීම සැලසුම්කර තිබුණත් වැඩමුළු 04 ක් පමණක් පවත්වා තිබුණි.

(v). ගොවි සංවිධාන ශක්තිමත් කිරීමේ වැඩසටහන් 12 ක් සැලසුම්කර තිබුණත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(vi). නව කුළුබඩු භෝග 02 ක් හඳුන්වාදීමට සැලසුම්කර තිබුණත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(vii). ත්‍රෛමාසික සඟරාවක් එළිදැක්වීමට සැලසුම් කළත් වර්ෂය තුළ සඟරා 02 ක් පමණක් එළිදක්වා තිබුණි.

(viii). ශ්‍රී ලංකා කජු සංස්ථා පනතට (1972 අංක 11 දරණ) සංශෝධන එකතු කිරීමට සැලසුම් කළත් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.7 අවිධිමත් ගනුදෙනු

2012 ජුනි 03 සිට 10 දක්වා කාලය තුළ ඉන්දියාවේ ලක්නව්හි පැවති උක් වගාව පිළිබඳ පර්යේෂණ සමුළුවක් සඳහා විෂයභාර අමාත්‍යවරයා සහභාගිවී තිබුණු අතර කොටි හිතවාදීන්ගේ විරෝධතා හේතුවෙන් ජුනි 07 දින ආපසු පැමිණ තිබුණි. මෙම විදේශ ගමන සඳහා දින 08 කට අනියම් දීමනා හා ඒකාබද්ධ දීමනා ලෙස ඇ.ඩො.2,800 ක් ගෙවා තිබුණත් සංචාරය කලින් නිමකර ආපසු පැමිණ තිබුණු බැවින් දින 02 ක් සඳහා වැඩියෙන් ගෙවූ දීමනා ඇ.ඩො.700 ක් ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 1.8 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 11 | 03 |
| (ii) | තෘතියික මට්ටම | 01 | 01 | - |
| (iii) | ද්විතියක මට්ටම | 51 | 36 | 15 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 27 | 23 | 04 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 02 | 02 | - |
| | එකතුව | 95 | 73 | 22 |

- සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 22 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

2. විසර්ජන ශීර්ෂය **289** - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**2.1 විගණන විෂය පථය**

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා, සැසැඳුම් ප්‍රකාශන , පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර් ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2012 සැප්තැම්බර් 12 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150,හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත කිරීම ගණන් දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2.3 විගණන නිරීක්ෂන**

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.10

දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ගිණුම් ඉදිරිපත් කිරීම**

දෙපාර්තමේන්තුව විසින් 2013 මාර්තු 31 දින වන විට පහත සඳහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර තිබුණි.

| ශීර්ෂය/විෂය අංකය | ගිණුමේ නම |
|---|---|
| 289 | විසර්ජන ගිණුම |
| 2890 1 | රජයේ නිලධාරීන්ට අත්තිකාර්ම ගිණුම |

**(ආ) අයවැය විචලනය**

(i) එක් වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු. 5,500,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 52 ක් යටතේ එකතුව රු. 559,960,000 ක ප්‍රතිපාද සලසා තිබුණු අතර එයින් රු. 500,474,639 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු රු.59,485,361 ක ඉතිරියක් විය. එම ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 100 දක්වා වූ පරාසයක පැවතුණි.

(iii) 2012 මූලික ඇස්තමේන්තුවල නිශ්චිතව සඳහන් කළ කාර්යයන් හැරුණුවිට ඉන් පරිබාහිරව එක් කරුණක් සඳහා රු. 31,700,000 ක ප්‍රතිපාදන ලබා ගෙන තිබුණි.

**(ඇ) අග්‍රිම ගිණුම්**

2013 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව සතුව රු.527,800,604 ක් වූ අග්‍රිම හර ශේෂ හා රු. 527,800,270 ක් වූ බැර ශේෂ පැවතුණු අතර වෙනස රු.334 ක් ඉතිරි අග්‍රිම ලෙස භාණ්ඩාගාරයට පියවා තිබුණි.

**(ඈ) පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 02 ක් ඉක්ම වූ රු. 947,220 ක් වූ තැන්පතු ශේෂ 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඉ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විශ්‍රාමයාම,මියයාම හා සේවය අතහැරයාම හේතුවෙන් රු. 908,016 ක් වූ හිඟ ණය ශේෂ 2012 දෙසැම්බර් 31 දින වන විටත් නොපියවා පැවතුණු අතර, ඉන් රු. 243,550 ක ණය ශේෂයක් වසර 11 සිට 17 දක්වා වූ කාලයක් තුළ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 2.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2012-2016 දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්මක් පිළියෙ කර තිබුණි.

### 2.4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

ඉහත 2.4.1 ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2012 වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි.

### 2.4.3 වාර්ෂක කාර්ය සාධන වාර්තා

ඉහත 2.4.1 ඡේදයේ දැක්වෙන පරිදි රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2012 සැප්තැම්බර් 12 හා පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402(1) ප්‍රකාර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළයුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත්, සමාලෝචිත

වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 අගෝස්තු 27 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**2.4.4 වාර්ෂක ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණි.

**2.4.5 අභ්‍යන්තර විගණනය**

දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර තිබුණද, කිසිදු වැඩ සටහනක් සමාලෝචිත වර්ෂයේ තුළ දී සුදුකර නොතිබුණි.

**2.4.6 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

සමාලෝචිත වර්ෂයේ දී විගණන හා කළමනාකරණ කමිටුව වාර 03 ක දී රැස්ව තිබුණි.

**2.5 වත්කම් කළමනාකරණය**

**(අ) නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවති බව නියදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|
| (i) ගොඩනැගිලි | 03 | 03 ට වැඩි |
| (ii) වාහන | 03 | 03 ට වැඩි |
| වාහන | 06 | 01- 03 අතර |
| (iii) වෙනත් වත්කම් | | |

| | | |
|---|---|---|
| අලවංගු | 33 | 03 ට වැඩි |
| සූර්ය දීප්තමාන | 04 | 30 ට වැඩි |

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 මාර්තු 31 දිනට ප්‍රථම සිදුකර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් එම වාර්තා ඉදිරිපත්කර තිබුණේ 2013 අප්‍රේල් 18 වන දින වාර්තා 20 ක් සහ 2013 ජුනි 19 වන දින වාර්තා 14 ක් වන පරිදිය. එමෙන්ම මෙම වාර්තා මගින් පෙන්වා ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

රජයට හා පෞද්ගලික අංශයට අයත් ඉඩම් කැබලි 49 ක ( භූමි ප්‍රමාණය අක්කර 350 ක් ) භාණ්ඩාගාර ප්‍රතිපාදන උපයෝගී කරගෙන ඉදිකිරීම් සිදුකර තිබුණි.

**(ඈ) බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුව විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.98,198,055 ක් වූ අතර, ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.

| **වර්ෂ 01 ට අඩු** | **වර්ෂ 01 ට වැඩි වර්ෂ 05 ට අඩු** | **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|---|
| **රු.** | **රු** | **රු.** |
| 89,137,371 | 9,060,684 | 98,198,055 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාර්ෂික ඇස්තමේන්තුව මගින් වෙන්කර දී තිබූ ප්‍රතිපාදන සීමාව ඉක්මවා පුනරාවර්ථන වැය විෂයන් 14 ක රු. 1,935,304 ක් ද, මූලධන වැය විෂයයක රු.3,602,962 ක් ද වශයෙන් රු.5,538,266 ක බැරකම් වලට 2012 වර්ෂය තුළ එළඹී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයට අදාල වැය විෂයයන් 19 ක් සඳහා 2013 අප්‍රේල් 30 දක්වා ගෙවන ලද රු. 1,505,673 ක වියදම් විසර්ජන ගිණුමේ බැරකම් යටතේ දක්වා නොතිබුණි.

(iii) 2012 වර්ෂයට අදාලව විසර්ජන ගිණුමේ බැරකම් පිළිබඳ ප්‍රකාශය අනාවරණය කර තිබුණු බේරුම් නොකළ බැරකම් වටිනාකම රු.15,198,055 ක් වූ අතර, ගිවිසුම් හා බැඳීම් තහවුර කර ගැනීමට අදාලව ලේඛනගත සාක්සිවල වටිනාකම රු.47,144,780 ක් වූයෙන් එම අගයන් දෙක අතර රු.31,946,725 ක හඳුනා නොගත් වෙනසක් නිරීක්ෂණය විය.

## 2.6 අනුකූල නොවීම

නියදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහකර පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(i) මුදල් රෙගුලාසි** | | |
| මූ.රෙ. 106 හා 109(1) | -- | පැල සහතික කිරීමේ සේවාවක් දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක කර තිබුණු නමුත් වියලී ගිය පැල සම්බන්ධයෙන් පොත්පත්වල හා ලේඛනවලින් අත්හැර දැමීම සඳහා කටයුතුකර නොතිබුණි. |
| මූ.රෙ.115(4) | 577,500 | ඉකුත් වර්ෂවලට අදාල වියදම් දරා තිබුණ නමුත් ඒ සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

**(ii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 චක්‍රලේඛය | -- | සෑම මාස 06 කට වරක් ඉන්ධන දැවීම පිළිබඳ පරීක්ෂා කළයුතු වුවත්, දෙපාර්තමේන්තුව සතු වාහන 67 ක් සහ ට්‍රැක්ටර් 11 ක් සඳහා ඒ පරිදි කටයුතු කර නොතිබුණි. |

## 2.7 බැංකු ගිණුම් මෙහෙයුමේ අඩුපාඩු

### (අ) බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමේ දීර්ඝ ප්‍රමාදයන්

බැංකු ගිණුමකට අදාල බැංකු සැසැදුම් පිළියෙල කිරීමේ දීර්ඝ ප්‍රමාදයන් දක්නට ලැබුණි. විස්තර පහත දැක්වේ.

| **බැංකු ගිණුම** | **2013 අප්‍රේල් 30 දින වන විට පිළියෙල කර නොතිබූ බැංකු සැසඳුම්වලට අදාල වර්ෂය හා මාසය** |
|---|---|
| 1- කළුතර | 2012 නොවැම්බර් හා දෙසැම්බර් |

### (ආ) ගැලැපුම් කළයුතු ශේෂ

අපනයන කෘෂි කර්ම දෙපාර්තමේන්තුව 2012 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශනවල දැක්වුණු ගැලැපුම් පිළිබඳ විග්‍රහය ට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| **ගැලපුම් පිළිබඳ විස්තර** | **කාල විශ්ලේෂණය** | | **එකතුව** |
|---|---|---|---|
| | **මාස 06 ට වැඩි වර්ෂ 01 ට අඩු** | **වර්ෂ 01 ට වැඩි 03 ට අඩු** | |
| | **රු.** | **රු.** | **රු.** |
| (i) උපලබ්ධි නොවූ තැන්පතු | 45,848 | - | 45,848 |

| | | | |
|---|---|---|---|
| (ii) නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 85,602 | 36,298 | 121,900 |

## 2.8 පාඩු හා හානි

දෙපාර්තමේන්තුවට අයත් අංක 32-1461 දරන පැජරෝ වර්ගයට අයත් ජීප් රථය 2012 ජුලි 26 දින සොරුන් විසින් පැහැරගෙන ගොස් ඇති බවට රියදුරුගේ ප්‍රකාශය හා මු.රෙ.104(3) පරිදි වූ මූලික පරීක්ෂණ මගින් හඳුනාගෙන තිබුණු නමුදු මු.රෙ.104(4) ප්‍රකාරව පරීක්ෂණයෙන් පසුව අලාභය සිදුවූ දිනයේ සිට තුන් මසක් ඇතුළත ඉදිරිපත් කළයුතු පූර්ණ වාර්තාව 2013 ජුනි 03 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

## 2.9 අනාර්ථික ගනුදෙනු

(අ) දෙපාර්තමේන්තුවට අයත් ගොවිපලවල් විසින් රෝපන මාධ්‍ය මිල දී ගැනීමේ දී 2012 වර්ෂයේ දී ප්‍රවාහන වියදම් ද, ඇතුළත්ව ගස්නාව ගොවිපල සඳහා මිලදී ගනු ලැබූ රෝපන මාධ්‍ය සඳහා ගෙවන ලද මිල ගණන් සහ භෞතික මිල ගණන් පිළිබඳ පරීක්ෂාවේ දී රු.100,050 ක වැඩිපුර ගෙවීමක් සිදුව ඇති බව නිරීක්ෂණය විය.

(ආ) ගොවිපල ගබඩා 02 කට අදාලව පැල තවාන් කිරීම හා ඒ ආශ්‍රිත කටයුතු සඳහා භාවිතයට ගන්නා පොලිතින් පිළිබඳ සිදු කරන ලද පරීක්ෂාවේ දී වර්ෂ 05 කට පෙර මිල දි ගන්නා ලද පොළිතින් දෙපාර්තමේන්තුවේ වෙනත් පැල තවාන්හි අවශ්‍යතා සඳහා හුවමාරු කරගනු වෙනුවට සෑම වසරක් පාසා ක්‍රමවත් වැඩ පිළිවෙලකින් බැහැරව පොලිතින් මිල දි ගෙන තිබීම හේතුවෙන් පැරණි තොග කල් ඉකුත් වීමේ අවදානමකට ලක් වී තිබූ බව නිරීක්ෂණය විය.

| පරීක්ෂාකළ ගබඩාව | මිලදී ගත් දිනය | පරිමාණය | ප්‍රමාණය |
|---|---|---|---|
| මාතලේ පර්යේෂණ හා ගොවිපල ගබඩාව | 2004.12.20 ට පෙර | 10''x 12' | 40,000 |
| | 2008.01.25 ට පෙර | 10''x 07' | 44,000 |

| | | | |
|---|---|---|---|
| බ්ලැක් වෝටර් ගොවිපල ගබඩාව | 2007.10.16 ට පෙර | 10"x 07' | 24,475 |
| | | | 108,475 |
| මාතලේ පර්යේෂණ හා ගොවිපල ගබඩාව | පැරණි අභාවිත | විවිධ පරිමාන | කි.ග්‍රෑ.201.5 |

## 2.10 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 84 | 49 | 35 | - |
| (ii) | තෘතියික මට්ටම | 05 | 04 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 823 | 322 | 501 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 354 | 315 | 39 | - |
| (v) | වෙනත්(අනියම්/තාවකාලික /කොන්ත්‍රාත් පදනම) | 97 | 130 | - | 33 |
| | එකතුව | 1,363 | 820 | 576 | 33 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 576 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ii) බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.